# රබර් ශාකයේ පට්ටය වියලීම අවම කර ගත හැක්කේ කෙසේද?

වසන්ත සෙනෙවිරත්න

ශ්‍රී ලංකාවේ දැනට පවතින රබර් නිෂ්පාදනය හා ඵලදායිතාවය සැලකීමේ දී වසරකට හෙක්ටයාරයකින් කිලෝග්‍රෑම් 1200 කට ආසන්න අස්වැන්නක් ලැබේ. පසුගිය වසර කිපය තුල ඵලදායිතාව සැලකීමේ දී මෙය තරමක වැඩිවීමක් වුවත් දැනට වගා කරන, රබර් පර්යේෂණායතනයෙන් නිර්දෙශිත ක්ලෝන වලින් ලබාගත හැකි අස්වැන්න සැලකීමේදී එය අඩු අගයකි. මේ සඳහා බලපාන විවිධ හේතු (ගුණාත්මයෙන් අඩු පැළ භාවිතය, පොහොර නිසි ලෙස නොයෙදීම, දුර්වල නඩත්තුව ආදි) අතරින් රබර් ශාකයේ පට්ටය වියලීමද බෙහෙවින් බලපායි. දැනට වගා වල පවතින ක්ලෝන සැලකීමේ දි පට්ටය වියලීමේ ප්‍රතිශතය 0 - 30% පමණ පරාසයක පවතින අතර, සමහර විට අවුරුදු 20 ක් පමණ වන වගාවන් වල මෙම තත්ත්වය 30% ද ඉක්මවයි. සාමාන්‍යයෙන් අවුරුදු 15 ක් පමණ වයසෙන් යුතු රබර් වගාවල පතේල වියලීමේ ප්‍රතිශතය 5% ක් පමණ වීම සාධාරණීකරණය කළ හැකි වුවත් ඉතා වැඩි අගයන් තිබීමත්, විශේෂයෙන් අඩු වයසක දි (අවුරුදු 10 ට අඩු) 5% කට වැඩි ප්‍රතිශතයකින් තිබීමත් ඉතාමත් අයහපත් තත්ත්වයකි.

ආසන්න වශයෙන් පට්ටය වියලීමේ ප්‍රතිශතයට සමාන අගයකින් වගාවේ අස්වැන්න ද, එමඟින් ලැබිය යුතු ආදායම ද අඩු වීමක් සිදු වේ. වගාව පරිණත වීමත් සමඟම මෙම තත්ත්වය උග්‍ර වීමද දැකිය හැක. පට්ටය වියලුනු ගස් වලින් නැවත කිරි ලබා ගැනීම සඳහා නිසි ප්‍රතිකාරයක් තවමත් සොයා ගැනීමට නොහැකිව ඇත්තේ මෙම අසාමාන්‍ය තත්ත්වය සිදු වන ආකාරය නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි වීම ඇතුළු තවත් විවිධ හේතු රාශියක් බලපාන නිසාත්ය. එසේ නම් දැනට මේ සඳහා ඇති ප්‍රතිකර්මය කුමක්ද? කිරි නොකපා ගසට මාස හයක පමණ විවේක කාලයක් ලබා දි ඉන් අනතුරුව නැවත කිරි කැපීම ඇරඹීමත්, එවිටදී ද කිරි නොමැති නම් ගසේ විරුද්ධ පැත්තේ ඉහළින් ඇති පොත්තෙන් ක්‍රමානුකූලව කිරි ලබාගැනීම දැනට ඇති එකම නිර්දේශයයි. කරුණු එසේහෙයින් අපට තිබෙන හොඳම පිළියම රබර් ගසේ පට්ටය වියලීම අවම ප්‍රතිශතයක පවත්වා ගැනීමයි. එසේ කිරීමට නම් මේ සඳහා බලපාන විවිධ හේතූන් පිළිබඳ විමසා බැලීමක් අත්‍යාවශ්‍යය.

රබර් ගසට පීඩාවක් ඇතිවන ඕනෑම හේතුවක් පට්ටය වියලීමට ද බලපායි. ගුණාත්මයෙන් අඩු පැළ භාවිතය, පැළ වලට නිසි පෝෂණය නොලැබීම, අයහපත් වගා පාලනය, නිර්දේශිත කිරි කැපීමේ ක්‍රම වෙනුවට වැඩි වාර ගණනක් කිරි කැපීම, කිරි උත්තේජක (එතරල් වැනි) නිර්දේශිත ප්‍රමාණයට වැඩියෙන් යෙදීම සහ උත්තේජක යෙදීමේ දි අනුගමනය කළයුතු කිරි කැපීමේ වාර ගණන ඉක්මවීම මින් ප්‍රධාන තැනක් ගනී. කරුණු මෙසේ හෙයින්, පට්ටය වියලීම අවම කර ගැනීම සඳහා අප අනුගමනය කළ යතු කරුණු ද බොහෝය. ඉන් එක එකක් පිළිබඳව විමසා බලමු.

### *රබර් වගාවකට සුදුසු ඉඩම් තෝරා ගැනීම*

RRIC 100, 102, 121, 130 ක්ලෝන යොදා ගෙන මෑතක දී කළ විශාල පරිමාණයේ සමීක්ෂණයට අනුව, ජලයෙන් නිතර යටවන, ජලය නිතර රඳා පවතින, එසේම භූගත ජල මට්ටම රබර් ශාකයේ මුල පද්ධතියට ඉතා කිට්ටුවෙන් පවතින ඉඩම් වල පට්ටය වියලීමේ ප්‍රතිශතය ඉතාමත් අධික බව පෙනුණි. එබැවින් රබර් වගාවක් ඇරඹීමේ දී එවැනි පහත් බිම් මඟ හැරිය යුතු වේ. එසේම දැනට රබර් වගාකර ඇති, නිතර ජලය රඳා පවතින බිම් වල ජලය නිසි ලෙස බැසයෑමේ ක්‍රම භාවිතා කළ යුතුය. කෙසේ වුවත් මෙවැනි ඉඩම්වල රබර් ශාකයේ වර්ධනය දුර්වල වන බව විශේෂයෙන් මතක තබා ගතයුතු වේ.

### *රෝපන ද්‍රව්‍ය*

සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව දුර්වල වර්ධන වේගයක් සහිත ගස්වල එනම් කිරි කැපීම ප්‍රමාද වන ගස් මෙම අසාමාන්‍ය තත්ත්වයට ගොදුරු වීමේ ප්‍රවණතාවය වැඩි බව පෙනුණි. මින් පැහැදිලි වන්නේ අඩු වර්ධන වේගයක් සහිත ගුණාත්මයෙන් අඩු පැළවල පට්ටය වියලීමේ හැකියාව වැඩි බවයි. එබැවින් වගාවන් සඳහා ඉතා හොඳ මූල පද්ධතියක් සහිත, සරු අංකුරයකින් ලැබෙන, ඉහල වර්ධන වේගයක් සහිත, පැළ භාවිතා කළ යුතුය. මේ අනුව පැළ තෝරාගැනීමේ දී වසරකට අඩු තවාන් කාලයක් තුල හොඳින් වර්ධනය වු කොළ මාල දෙකක් සහිත ළපටි බද්ධ පැළ තෝරා ගැනීම වඩාත් සුදුසුවේ.

### *වගා පාලනය*

වගාවක් ඇරඹු දින සිටම නිසියාකාරව පොහොර යෙදීම, වල් මර්ධනය, පස සෝදා යාම අවම කිරීම, පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම ආදිය තුලින් ගසට දැනෙන විඩාව අවම කරගත හැක. එමඟින් ගස් වල වර්ධන වේගය වැඩි වන අතර නිර්දේශිත කාලසීමාව තුල දී කිරි කැපීම ඇරඹීමට හැකි වනවා සේම පට්ටය වියලීමේ ප්‍රවණතාවය ද අවම කර ගත හැක.

### *නිවැරදි අයුරින් කිරි කැපීම*

එක් එක් ක්ලෝනයන් සඳහා නිර්දේශිත කිරි කැපීමේ ක්‍රමයක් රබර් පර්යේෂණායතනය මඟින් හඳුන්වා දී ඇත්තේ ඒවායෙන් ලැබෙන අස්වැන්න අනුව ගසට දැනෙන අපහසුතාවය අවම කිරීමේ අරමුණෙනි. එමනිසා නිර්දේශිත ලෙස අස්වැන්න ලබා ගැනීම ඉතාම වැදගත්වේ. දින තුනකට වරක් කිරි කපන ගස් වල මෙම අසාමාන්‍ය තත්ත්වය දින දෙකකට වරක් කිරි කපන ගස් වලට වඩා අඩුය. නිදසුනක් ලෙස වසරකට කිරි කපන දින ගණන දින 250 ක් පමණ වන වගාවන් වල පට්ටය වියලීම අඩු අගයක පවතින අතර එම දින ගණන 300 ඉක්ම වු වගාවල පට්ටය වියලීමේ ප්‍රතිශතය වැඩි අගයක් වීමෙන් ද එය තවදුරටත් පැහැදිලි වේ. මේ නිසා, ක්ලෝනය අනුව නිර්දේශිත කිරි කැපීමේ ක්‍රම (දින දෙකකට හෝ තුනකට වරක්) අනුගමනය කල යුතුය.

තවද කැපුම් ශිල්පින්ගේ අත්දැකීම් අනුව කැපුම් කට්ටය තෙත්ව ඇතිවිට කිරි කැපීම සහ වැසි සහිත කාලගුණික තත්ත්ව යටතේ කිරි කැපීමේ දී පට්ටය වියලීමේ ප්‍රවණතාවය වැඩි බව පෙනී ගොස් ඇත.

***කිරි උත්තේජක භාවිතය***

රබර් සඳහා උත්තේජක භාවිතය හඳුන්වා දී ඇත්තේ ඉන් වැඩිපුර අස්වැන්නක් ලබා ගැනීමට නොව, කිරි කැපුම් ශිල්පීන්ගේ හිඟතාවයට පිළියමක් ලෙස වාර්ෂිකව අඩු වාර ගණනක් කිරි කපා ගසෙන් ලබාදිය හැකි හොඳම අස්වැන්න ලබා ගැනීමටයි. බොහෝ දෙනෙකු සිතන්නේ සහ ක්‍රියාකරන්නේ උත්තේජක වලින් දැනට ලබා ගන්නවාට වඩා වැඩි අස්වැන්නක් ලබා ගැනීමටයි. මෙය නිවැරදි නොවේ. එසේ කිරීමෙන් තාවකාලිකව වැඩි අස්වැන්නක් ලැබුන ද, දීර්ඝ කාලීනව ඉතාමත් අහිතකර ප්‍රතිඵලයක් ලෙස කැපුම් පට්ටය වියලුනු ගස් ප්‍රමාණය දිනෙන් දින වැඩිවිය හැක. මෙසේ සිදු වන්නේ මන්ද? උත්තේජක වැඩිපුර යෙදීමත්, උත්තේජක යෙදීමේ දී කිරි කැපීමේ දින ගණන අඩු නොකර සාමාන්‍ය පරිදි කිරි කැපීම සිදු කිරීමත් මීට ප්‍රධාන හේතූන්ය. උදාහරණයක් ලෙස, උත්තේජ භාවිතා නොකර දින දෙකකට වරක් කිරි කපන ශාකයක උත්තේජක යොදා (මාස තුනකට වරක් 2.5% එතරල් ග්‍රෑම් 1.6 ක්) කිරි කැපීමේදී දින තුනකට වරක් කිරි කැපීම කළ යුතුය. මෙසේ කිරි කැපීම තුලින් රබර් වගාවේ ගස්, පට්ටය වියලීමට ගොදුරු වීම අවම කර ගතහැකිය.

සාමාන්‍ය ලෙස කිරි ලබාදෙන ශාකයක් පට්ටය වියලීමට ගොදුරු වීමට ප්‍රථම කැපුම් ශිල්පියෙකුට පහසුවෙන් හඳුනා ගත හැක. ඒ කෙසේද? මෙවැනි ශාකයකින් දිනෙන් දින ලැබෙන කිරි ප්‍රමාණයේ ඉතා වැඩිවීමක් ක්ෂණිකව පෙන්වන අතර කිරි වැස්සීමේ කාලයද පැය ගණනකින් දිගු වේ. ඊළග දිනයේදී කිරි කැපීමේ දී එම ගස් වල බඳුන් වල මිඳී ඇති කිරි ප්‍රමාණය වැඩි වීමෙන්ද මෙය තවදුරටත් හොඳින් නිරීක්ෂණය කළ හැක. මෙසේ හඳුනාගත් ගස්වලට වැඩි අවධානයක් යොමු කළ යුත්තේ ඒවායින් තව තවත් වැඩියෙන් කිරි ලබා ගැනීමේ අදිටනින් නොව, මෙම ගස් වලින් තවදුරටත් කිරි ලබා ගැනීම සඳහා ඒවා ආරක්ෂා කරගත යුතු බැවිනි. එහෙයින්, එම ශාක අමතර කිරි කැපීමෙන් නිදහස් කළ යුතු අතර කිසිවිටෙක මෙවැනි ගස් වලට උත්තේජක ලබා නොදිය යුතුය. හඳුනාගත් විගස මෙවැනි ගස් වල කිරි කැපීම තාවකාලිකව නවත්වන්නේ නම්, දිගුකාලීනව වාසිදායක වේ. එසේ නොවුවහොත්, මෙම ගස්වල අස්වැන්න දිනෙන් දින ක්‍රමයෙන් අඩුවී අවසානයේදී කිරි ගැලීම නතරවී වියලී යයි.

රබර් ගසෙන් අස්වැන්න ලබාගැනීම අපගේ අනෙකුත් එළදරන ශාක වල අස්වැන්න ලබාගැනීමට වඩා බෙහෙවින් වෙනස්ය. මක් නිසා ද යත්, ගසක් එල දරන්නේ තම වර්ගයා බෝ කිරීම සඳහාත්, අන් අයගේ ප්‍රයෝජනය සඳහාත් බැවින්, එම ගස් වලින් අස්වනු නෙලාගැනීමේදී ගසට කිසියම් අපහසුතාවයක් නොදැනීම නිසාය. නමුත් රබර් ගසින් අස්වනු නෙලීමේ දී අප ගසට තුවාලයක් සිදු කර ගස මහත් අපහසුතාවයකට පත්කර අස්වැන්න ලබා ගනී. එමනිසා සිදු වූ තුවාලයට විරුද්ධව ද ගස ප්‍රතික්‍රියා කරයි. ගසට නැවත යථා තත්ත්වයට පත්වීම සඳහා යම් කාලයක් අවශ්‍ය වන බැවින් මේ කාලය තුල ගසට අමතර පීඩාවක් නොලැබිය යුතුය. දිනපතා කිරි කැපීම හෝ කිරි උත්තේජක වැඩිපුර ලබාදීම මඟින් ගසට දැනෙන අපහසුතාවයට විරුද්ධව ගස ප්‍රතික්‍රියා කර තම පැවැත්ම උදෙසා කිරි නිපදවීම හෝ ගැලීම නතර කරයි. පට්ටය වියලීම ලෙස අප දකින්නේ මෙම තත්ත්වයයි. එමනිසා රබර් ගසට අධික පීඩාවක් දැනිය හැකි ඉහත දී සඳහන් කළ හේතු හැකි තරම් දුරට ඉවත් කළ යුතුය.

එසේනම් රබර් වගාවට සුදුසු හොඳ භූමි තෝරා ගැනීම, තත්ත්වයෙන් උසස් ගුණාත්මක පැළ භාවිතය, පොහොර යෙදීම, වල් නෙලීම ආදිය නිසි කලට සිදු කරමින් වගාව හොඳින් පවත්වා ගෙන යාම, නිර්දේශිත කිරි කැපීමේ ක්‍රම අනුගමනය කිරීම, කිරි උත්තේජක නිසි පරිදි භාවිතය සහ ඊට අනුකූලව කිරි කැපීම තුලින් රබර් ශාකයට ඇතිවිය හැකි අපසුතාවයන් අවම කර ගැනීමෙන් පට්ටය වියලීම සහ ඒ

තුලින් අහිමිවන අස්වැන්න අවම කර ගැනීමෙන් අපගේ වගාවන් වල උපරිම අස්වැන්න සහ ලාභය ලබා කර ගත හැක. තවමත් අප ප්‍රමාද නැත. අපි ඒ සඳහා දැන් සිටම කටයුතු කරමු. රබර් ගස සෞඛ්‍ය සම්පන්නව දිවි ගෙවනතාක් අපගේ දිවියද සෞඛ්‍ය සම්පන්නව ගෙවිය හැක. එසේ නම් එය පෝෂණය කර රැකබලා ගැනීම අපගේ පරම යුතුකමක් වනු ඇත.